# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජුලි 2017

## (AA15) ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණය

(Business Operations and Management)

---

ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණ විෂය ක්ෂෙත්‍රයේ සියලුම අංශ ආවරණය කිරීම මෙම ප්‍රශ්න පත්‍රයේ අරමුණ විය. මෙම පරීක්ෂක වාර්තාවේ ප්‍රධාන අරමුණ වන්නේ කාර්යසාධනය අඩු මට්ටමේ තිබූ ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමුකොට, අයදුම්කරුවන්ගේ අනාගත කාර්යසාධනය ඉහළ නංවාලීමට උපකාර වීමය.

අයදුම්කරුවන්ගෙන් බහුතරයක කාර්යසාධනය සතුටුදායක බව පෙනී ගියේය. එසේවුවත්, පහත දක්වනු ලබන අඩුපාඩුකම් නිසා, ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්න හරිහැටි තේරුම් ගැනීමට අපොහොසත් වූ බව නිරීක්ෂණය විය:

### A - කොටස

### ප්‍රශ්න අංක 01

ලකුණු 100 න් ලකුණු 40 ක් වෙන්කර තිබූ මෙම කොටස තුලින් ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණ විෂය ක්ෂේත්‍රයට අයත් මුළු විෂය පථයම ආවරණය කර තිබුණේය. අයදුම්කරුවන්ගෙන් සැළකිය යුතු ප්‍රතිශතයක් මෙම කොටසට උත්තර සපයා ඉහළ ලකුණු ලබා තිබේ. ප්‍රශ්න අංක 1.3, 1.7, 1.8 සහ 1.20 සඳහා අයදුම්කරුවන් බොහොමයක් සාර්ථකව උත්තර ලියා නොතිබූ බව පහත පෙන්වා දී ඇති පරිදි නිරීක්ෂණය විය:

1.3 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය වන ලියවිලි පිළිබඳ අවබෝධය මැන බැලීම අපේක්ෂා කරන ලදී. එහෙත් අයදුම්කරුවන් බොහෝ දෙනෙකු නිවැරදි උත්තරය වන අංක 4 ලකුණු කර නැත්තේ උත්තරය ලෙස බලාපොරොත්තු වූයේ අවශ්‍ය නොවන ලියවිල්ල කුමක්ද යන්න බව හරිහැටි වටහා නොගැනීම නිසා බව පෙනේ. බහුතරය අංක 2 උත්තරය ලෙස ලකුණු කර තිබුණි.

1.7 මෙහිදිද හෙන්රි මින්ට්ස්බර්ග් අනුව කළමනාකරුවෙකුගේ භූමිකාවක් **නොවන්නේ** කුමක්ද යන්න දැක්වීම අපේක්ෂා කළද, නිවැරදි උත්තරය වන (3) සංකල්පනාත්මක භූමිකාව වෙනුවට වෙනත් උත්තර ලියා තිබුණි. ප්‍රශ්නය හරිහැටි කියවා තේරුම්ගෙන උත්තර ලිවීම වැදගත් වේ.

1.8 අයදුම්කරුවන්ගෙන් බහුතරය දත්ත සහ තොරතුරු අතර වෙනස අවබෝධ කරගෙන නැත. එමනිසා දී තිබූ උදාහරණවලින් නිවැරදි උත්තරය ඔවුන්ට තෝරාගත නොහැකිවී ඇත.

1.20 අයදුම්කරුවන් බොහොමයකට ගුණාත්මක කළමනාකරණ පද්ධතියක අවශ්‍යතාවයන් පිළිබඳ වැටහීමක් තිබී නැත. ගුණාත්මක සහතිකවීම් සහ වාණිජ්‍යය ආශ්‍රිත වෙනත් නූතන ප්‍රවණතා පිළිබඳව දැනුම වර්ධනය කර ගැනීම අතිශයින් වැදගත් වේ.

අංක 1.1 සිට 1.15 දක්වා ප්‍රශ්නවලට උත්තර ලෙස තෝරාගත් උත්තරයට දී ඇති අංකය ලිවිය යුතු බව පැහැදිලි ලෙස සඳහන් කර තිබුණද, ඒ වෙනුවට සම්පූර්ණ උත්තර ලියා තිබූ ඇතැම් අයදුම්කරුවන් සිටි බව නිරීක්ෂණය විය. මෙය අනෙකුත් ප්‍රශ්න සඳහා උත්තර ලිවීමට වෙන්කර දී ඇති කාලය අපතේ යැවීමකි.

ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණ විෂයට අදාල මූලික සංකල්ප පිළිබඳ දැනුම වැඩිදියුණු කර ගැනීමට අයදුම්කරුවන් ක්‍රියා කළ යුතුය. ඉහත දක්වා ඇති කරුණු හැරුණුවිට අයදුම්කරුවන් හොඳින් උත්තර සපයා තිබූබව සඳහන් කළ යුතුය. අංක 01 ප්‍රශ්නය සඳහා සමස්ථ කාර්යසාධනය සතුටුදායක බව කිව හැකිය.

## B - කොටස

මෙම කොටසේ එකකට ලකුණු 10 බැගින් ලැබෙන අනිවාර්ය ප්‍රශ්න 4 ක් සඳහා ලකුණු 40 ක් වෙන්කර ඇත.

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය **ව්‍යාපාරික සංවිධාන** සහ **උපකාරක සේවා** ක්ෂේත්‍රය පදනම්ව සකස්කර තිබුණි.

(a) කේවල ස්වාමි ව්‍යාපාරයක ලක්ෂණ 3 ක් පැහැදිලි කිරීම මෙම කොටසින් අපේක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකු මෙම කොටසට උත්තර ලියා ලකුණු ලබාගෙන තිබුණි. ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නයේ අවශ්‍යතාවය වටහාගෙන නොතිබූ බව පෙනුණි. සමහරු ලක්ෂණ සඳහන් කරනවා වෙනුවට කේවලස්වාමි ව්‍යාපාර ක්‍රමය අනෙකුත් ව්‍යාපාර සංවිධාන වර්ග වලට වඩා වාසිදායකවීම පිළිබඳව ලියා තිබුණි.

(b) මෙම කොටසට උත්තර ලියූ අයදුම්කරුවන් අතුරෙන් සැහෙන ගණනක් මෙම ප්‍රශ්නයේ අවශ්‍යතාවය වටහාගෙන නොතිබූ බව පෙනී ගියේය. ව්‍යාපාර සංවිධානයකට රක්ෂණයක වැදගත්කම පැහැදිලි කරනවා වෙනුවට, රක්ෂණය යන්න නිර්වචනය කොට රක්ෂණ ඔප්පු වර්ග පැහැදිලි කිරීම සමහර අයදුම්කරුවන් විසින් කර තිබුණි. ප්‍රශ්නය අවබෝධ කරගත් අයදුම්කරුවන් ඉහළ ලකුණු ලබා ගැනීමට සමත් විය.

### ප්‍රශ්න අංක 03

**ව්‍යාපාර පරිසරය** පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කරන ලදී.

(a) (i) මෙම ප්‍රශ්නයට වෙන්කර තිබූ මුළු ලකුණු උපයාගෙන තිබුණේ අයදුම්කරුවන්ගෙන් ස්වල්ප දෙනෙකු පමණි. ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලද්දේ කුමක්දැයි සමහර අයදුම්කරුවන් අවබෝධ කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. සමහර අයදුම්කරුවන් අභ්‍යන්තර පරිසරය සහ බාහිර පරිසරය පටලවාගෙන තිබූ අතර, සූක්ෂ්ම පරිසරය සහ සාර්ව පරිසරය වැනි වැරදි උත්තර සපයා තිබුණේය. සමහර අයදුම්කරුවන් විසින් අභ්‍යන්තර පරිසරයේ මූලිකාංග ලෙස, සැපයුම්කරුවන්, ගනුදෙනුකරුවන් සහ තරඟකරුවන් වැනි පාර්ශවකරුවන් සඳහන් කර තිබුණි.

(ii) මෙම කොටසට උත්තර සැපයූ අයදුම්කරුවන් අතර, සූක්ෂ්ම පරිසරය සහ සාර්ව පරිසරය අතර වෙනස තේරුම් නොගෙන උත්තර ලියූ ඇතැම් අයදුම්කරුවන්ද විය. ඒ දෙක අතර වෙනස හඳුනා දැක්වීම වෙනුවට ඔවුන් ඒවා නිර්වචනය කර දක්වා තිබුණි. සමහරුන් මේ දෙක පටලවා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැරදි උත්තර ලිවීමද සිදුකර තිබුණේය.

(b) පෝටර්ගේ පංචබල විශ්ලේෂණ ආකෘතියේ බල මූලාශ්‍ර ලෙස අලුතෙන් ඇතුළුවන්නන්ගෙන් ඇතිවන තර්ජන, සැපයුම්කරුවන්ගේ කේවල් කිරීමේ හැකියාව, ගැනුම්කරුවන්ගේ කේවල් කිරීමේ හැකියාව, පවත්නා තරඟකරුවන් අතර පවතින තරඟකාරිත්වය, ආදේශනවල භාණ්ඩ හෝ සේවාවල තර්ජනය යන මේවායින් දෙකක්, නිවැරදි ලෙස බොහෝ අයදුම්කරුවන් ලියා තිබුණි. එහෙත් අයදුම්කරුවන්ගෙන් සැහෙන ගණනක් මෙම බල මූලාශ්‍ර නිවැරදිව පැහැදිලි කිරීමට අපොහොසත් විය. ව්‍යාපාර මෙහෙයුම් කළමනාකරණයට අදාළ ආකෘති පිළිබඳ මනා දැනුමක් ස්ව-අධ්‍යයන පාඨමාලා පොත සහ වෙනත් අධ්‍යයන පොත්, සඟරා ආශ්‍රයෙන් දියුණු කරගැනීම වැදගත්ය.

මෙම ප්‍රශ්නයට ඉහළ ලකුණු ලබා ගැනීමට අයදුම්කරුවන්ගෙන් ඉතා සුළු පිරිසක් සමත් විය.

## ප්‍රශ්න අංක **04**

**මානව සම්පත් කළමනාකරණය** යටතේ බඳවා ගැනීම සහ තෝරා ගැනීම පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී.

(a) (i) අයදුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකු අපේක්ෂා කළ පරිදි මෙම ප්‍රශ්නයට උත්තර ලියා නැත. එයින් අදහස් වන්නේ ඔවුන් බඳවා ගැනීම සහ තෝරා ගැනීම අතර වෙනස නිසිලෙස හඳුනාගෙන නොමැති බවය. වෙනස පැහැදිලි කරනු වෙනුවට ඔවුන් කාර්යයන් දෙකේම ලක්ෂණ පැහැදිලි කර ඇත. අයදුම්කරුවන් කිහිප දෙනෙකු ඉලක්කයට උත්තර සපයා ඉහළ ලකුණු ලබා ඇත.

(ii) ලකුණු 10 න් ලකුණු 4 ක් මෙම කොටසට වෙන්කර තිබූ අතර, උත්තර ලියූ බහුතරය සතුටුදායක ලෙස ලියා තිබුණි. අයදුම්කරුවන් කීප දෙනෙකු තෝරාගැනීමේ ක්‍රියාවලිය, නිෂ්පාදන ක්‍රියාවලිය සමඟ පටලවාගෙන අදාල නොවන උත්තර සපයා තිබුණේය.

(b) මෙම කොටසට උත්තර ලියූ අයදුම්කරුවන් බහුතරය සාර්ථක ලෙස එය සිදුකර සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. අයදුම්කරුවන් කිහිප දෙනෙකු බාහිර බඳවාගැනීමේ වාසි සඳහන් කර තිබුණත්, අභ්‍යන්තර බඳවා ගැනීම සමඟ සසඳා බාහිර බඳවාගැනීමේ ඇති වාසි දක්වා තිබුණේ නැත. සමහර අයදුම්කරුවන් වැරදි ආකාරයට අභ්‍යන්තර සහ බාහිර බඳවා ගැනීම යන දෙකේම ලක්ෂණ ලියා තිබුණද අභ්‍යන්තර බඳවා ගැනීමට වඩා බාහිර බඳවා ගැනීමේ වාසි සඳහන් කර තිබුණේ නැත. එමනිසා ප්‍රශ්නය කියවාබලා තරයේ අවබෝධ කරගැනීම, උත්තර ලිවීමට පෙර අතිශයින් වැදගත් බව සැලකිය යුතුය.

අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ "මානව සම්පත් කළමනාකරණය" පිළිබඳ පරිච්ඡේදය නිසි අවධානය යොදවා අධ්‍යයනය කර තිබුණේ නම්, ඔවුන්ට පහසුවෙන්ම මෙම ප්‍රශ්නයට ලකුණු ලබාගත හැකිව තිබුණි.

## ප්‍රශ්න අංක **05**

මෙම ප්‍රශ්නය **අලෙවි කළමනාකරණය** මත පදනම්ව වී තිබුණි.

(a) එකකට උදාහරණ 02 බැගින් දෙමින් අවශ්‍යතා සහ වුවමනා අතර වෙනස සඳහන් කිරීම අපේක්ෂා කළ අතර, ලකුණු 10 න් 4ක් ඒ සඳහා වෙන්කර තිබුණි. අපේක්ෂිත පරිදි බොහෝ අයදුම්කරුවන්, අදාල උදාහරණද දෙමින් සාර්ථක ලෙස උත්තර සපයා තිබුණේය. අයදුම්කරුවන් කිහිප දෙනෙකු පද දෙක වෙන වෙනම නිර්වචනය කර තිබුණු නමුත් අවශ්‍යතා සහ වුවමනා අතර වෙනස සඳහන් කර නොතිබුණි. සමහර අයදුම්කරුවන් අවශ්‍යතා සහ වුවමනා සඳහා එකකට උදාහරණ දෙක බැගින් සඳහන් කිරීමට අපොහොසත් විය.

(b) සඵලදායී වෙළෙඳපොළ ඛණ්ඩනයක ලක්ෂණ 3 ක් පැහැදිලි කිරීම මෙම කොටසින් අවශ්‍ය විය. අයදුම්කරුවන්ගෙන් බහුතරය මේ සඳහා සතුටුදායක ලෙස උත්තර ලියා නොතිබීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙන්කළ ලකුණු 6 න් අඩු ලකුණු ලබා තිබුණි. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම කොටසට උත්තර ලියා තිබුණේම නැත. සමහර අයදුම්කරුවන් සඵලදායී වෙළෙඳපොළ ඛණ්ඩනයක මැනිය හැකි බව, ප්‍රමාණවත් බව, ළඟා විය හැකි බව, විවිධාංගීකරණය සහ ක්‍රියාවට නැංවිය හැකි බව වැනි ලක්ෂණ නිවැරදිව සඳහන් කර තිබුණි. එහෙත්, ඔවුන්ගෙන් බොහෝමයක් ඒවා නිවැරදිව පැහැදිලි කිරීමට අපොහොසත්වීම නිසා අඩු ලකුණු ලබා තිබුණි.

අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඨමාලා පොතේ අලෙවි කළමනාකරණයේ අන්තර්ගතය අධ්‍යයනය කළේනම්, මෙම ප්‍රශ්නයට සම්පූර්ණ ලකුණු ලේසියෙන් ලබාගත හැකිව තිබුණේය.

## ප්‍රශ්න අංක **06**

**සීමාසහිත ඇග්‍රෝ නිෂ්පාදිත පොදු සමාගම** සම්බන්ධයෙන් වූ සිද්ධිදාමය ආශ්‍රිතව මෙහෙයුම් කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය සහ බාහිර මූලාශ්‍රගතකරණය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා දී ඇති ප්‍රශ්නයකි. සමහර අයදුම්කරුවන් ප්‍රශ්නය හොඳින් කියවා තිබූ නොමැති බව නිරීක්ෂණය විය. වෙන් කළ ලකුණු 20 න් සැලකිය යුතු තරමේ අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම ප්‍රශ්නය සඳහා ඉහළ ලකුණු ලබාගෙන තිබුණි.

(a) අලුතින් සංවර්ධනය කළ යන්ත්‍රය හඳුන්වාදීම නිසා **සීමාසහිත ඇග්‍රෝ නිෂ්පාදිත පොදු සමාගමට** මුහුණ පෑමට සිදුවූ ප්‍රධාන ගැටළු සඳහා හේතු අයදුම්කරුවන්ගෙන් බහුතරය පැහැදිලි කර තිබුණි. එහෙත්, සමහර අයදුම්කරුවන් දී තිබූ සිද්ධිදාමයට ප්‍රායෝගික අන්දමින් සම්බන්ධ නොකර න්‍යායාත්මක කරුණු එලෙසින්ම නැවත ඉදිරිපත් කර තිබූ ආකාරය නිරීක්ෂණය විය. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම කොටසට හොඳින් ලකුණු ලබාගෙන තිබුණි.

(b) නව නිෂ්පාදිත නිර්මාණකරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම මෙම කොටසින් අපේක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ප්‍රශ්නය හරිහැටි වටහාගෙන නොතිබූ අතර, අපේක්ෂා කළ උත්තරද ලබාදී නැත. ඔවුන් නිෂ්පාදිත නිර්මාණ ක්‍රියාවලිය වෙනුවට කළමනාකරණයේ මූලික සංකල්ප පැහැදිලි කර තිබුණි. අයදුම්කරුවන් සුළු ගණනක් පමණක් සතුටුදායක අන්දමින් උත්තර ලියා වෙන්කළ ලකුණු 6 න් සතුටුදායක ලකුණු ලබාගෙන ඇත. නව නිෂ්පාදිත නිර්මාණකරණ ක්‍රියාවලියක් දියත් කිරීමේ පියවර වන්නේ අදහස් උත්පාදනය, ශක්‍යතා අධ්‍යයනය, ආකෘති නිර්මාණය, ශ්‍රිතමය සහ නිෂ්පාදිත නිර්මාණය, නියමු පරීක්ෂණය සහ නව නිෂ්පාදිතය දියත් කිරීම බව අයදුම්කරුවන් සැලකිල්ලට ගත යුතුය.

(c) සඵලදායී ප්‍රතිලාභ පද්ධතියක අරමුණු සඳහන් කිරීම මෙම කොටසින් අවශ්‍ය විය. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නය නිසි පරිදි අවබෝධ කර ගැනීමට අපොහොසත් වූ බව පෙනීගිය අතර, සමහරු එයට උත්තර ලිවීම කර තිබුණේ නැත. සඵලදායී ප්‍රතිලාභ පද්ධතියක අරමුණු වෙනුවට ප්‍රතිලාභ පද්ධතියක වාසි බොහෝ දෙනෙකු ලියා තිබුණේය.

(d) අයදුම්කරුවන්ගෙන් අඩකටත් වඩා ප්‍රශ්නය හොඳින් අවබෝධ කරගෙන නොතිබූ අතර, වෙළෙඳපොළ සමීක්ෂණය පැවැත්වීම, බාහිර මූලාශ්‍රගත කිරීමෙන් ලැබෙන වාසි වෙනුවට වෙළෙඳපොළ සමීක්ෂණයක් පැවැත්වීමෙන් ලැබෙන වාසි ඔවුන් ලැයිස්තුගත කර තිබුණි. අයදුම්කරුවන්, බාහිර මූලාශ්‍රගත කිරීමේ න්‍යායාත්මක සහ ප්‍රායෝගික පැතිකඩ සහ ව්‍යාපාරික මෙහෙයුම් සඳහා අනෙකුත් තාක්ෂණික යෙදවුම් භාවිතය පිළිබඳ මැනවින් අධ්‍යයනය කළ යුතුය.

අයදුම්කරුවන්ට පසුගිය ප්‍රශ්නවලට උත්තර ලියා පුරුදු පුහුණුවීම තුළින් මෙබඳු වර්ගයේ සිද්ධිදාම පාදක ප්‍රශ්න සඳහා ඉහළ ලකුණු පහසුවෙන්ම ලබාගත හැකිය.

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති පිළිතුර පිළිබඳව නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. ස්ව-අධ්‍යයන පාඩම් මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

4. පිළිතුරු ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීම සහ අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

5. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

6. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

7. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

8. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

9. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

10. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -